# ① ව්‍යාපාර පසුබිම - පිළිතුරු

1. තමා නිපදවන භාණ්ඩ අතිරික්තය අනෙකුත් පුද්ගලයන් සමඟ හුවමාරු කර ගනිමින් තමාට අවශ්‍ය අනෙකුත් භාණ්ඩ ඔවුන්ගෙන් ලබා ගැනීම භාණ්ඩ හුවමාරු ක්‍රමය නම් වේ.

2. ව්‍යාපාරයක් යනු මිනිස් අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය විවිධ වූ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම හෝ සැපයීම ආශ්‍රිත ආර්ථික කටයුත්තකි.

3.
    1) ලාභ ඉපයීම
    2) පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම

    } ප්‍රධාන අරමුණු

    3) භාණ්ඩ හා සේවාවල ගුණාත්වය ඉහළ නැංවීම
    4) රැකියා උත්පාදනය
    5) සේවක සුභසාධනය

    } උප අරමුණු/ ඉලක්ක

4. අවශ්‍යතා යනු ජීවත්වීම සඳහා අනිවාර්යෙන් සපුරා ගත යුතු දෑය.
    උදා: ආහාර, ඇඳුම්, නිවාස

    අවශ්‍යතා සපුරා ගන්නා විවිධ ආකාර වුවමනා වේ.

    ආහාර ⟶ බත්, පාන්, පිට්ටු, රොටී

5.

| අවශ්‍යතා | වුවමනා |
|---|---|
| සීමිත වීම | අසීමිත වීම |
| සරල වීම | සංකීර්ණ වීම |
| නිර්මාණය කළ නොහැකිවීම | නිර්මාණය කළ හැකිවීම |
| අත්‍යවශ්‍ය වීම | අත්‍යවශ්‍ය නොවීම |
| පොදු වීම | විවිධ වීම. |

6. මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරලිය හැකි වෙළෙඳපොලට ඉදිරිපත් කරන ඕනෑම දෙයක් නිෂ්පාදිතයක් වේ. උදා:- භාණ්ඩ හා සේවා

7.
    - භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර
    - සේවා සැපයීමේ ව්‍යාපාර

8. භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම සඳහා ව්‍යාපාරවලට අවශ්‍ය වන සම්පත් නිෂ්පාදන සාධක ලෙස හඳුන්වයි.

9. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසාය

10. ව්‍යාපාර කටයුතු පිළිබඳව උනන්දුවක් දක්වන විවිධ පාර්ශව ඇල්මැති පාර්ශව ලෙස හැඳින්වේ.

11. අයිතිකරුවන්, කළමනාකරුවන්, සේවකයන්, රජය
    (පෙළපොතේ සඳහන් ඕනෑම කරුණක් මේ සඳහා නිවැරදි වේ.)

12.

| ඇල්මැති පාර්ශවය | අරමුණු |
|---|---|
| අයිතිකරුවෝ | i. ප්‍රමාණවත් ලාභයක් ලැබීම<br>ii. ආයෝජනයේ සුරක්ෂිතතාවක් තිබීම. |
| කළමනාකරුවෝ | i. රැකියා වර්ධනය හා රැකියා තෘප්තිය<br>ii. තීරණ ගැනීම හා තීරණ ක්‍රියාත්මක කිරීම |
| සේවකයෝ | i. රැකියා සුරක්ෂිතභාවය<br>ii. සාධාරණ වැටුපක් ලබා ගැනීම |
| ගනුදෙනුකරුවෝ | i. ගුණාත්මක නිෂ්පාදන ලබා ගැනීම<br>ii. නිෂ්පාදිත සාධාරණ මිලට ලබා ගැනීම |

13. පහත දැක්වෙන අරමුණුවලට අදාළ ඇල්මැති පාර්ශ්වයන් නම් කරන්න.

| අරමුණ | ඇල්මැති පාර්ශ්වය |
|---|---|
| • අඛණ්ඩව ඇණවුම් ලබා ගැනීම | • සැපයුම්කරුවන් |
| • දෙන ලද ණය අයකර ගැනීම | • ණයහිමියන්/ මූල්‍ය ආයතන |
| • ලැබිය යුතු බදු ආදායම් නිසිලෙස ලබාගැනීම | • රජය |
| • තම නිෂ්පාදනවල මිල තීරණය කිරීම | • තරඟකරුවෝ |

14.




| | |
|---|---|
| 15. | ④ |
| 16. | ② |
| 17. | ③ |
| 18. | ① |
| 19. | ③ |
| 20. | ① |
| 21. | ③ |
| 22. | ② |
| 23. | ④ |
| 24. | ② |

| | |
|---|---|
| 25. | ✓ |
| 26. | × |
| 27. | ✓ |
| 28. | × |
| 29. | ✓ |
| 30. | × |
| 31. | ✓ |
| 32. | × |
| 33. | ✓ |
| 34. | × |

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

35.

I. සෞඛ්‍ය

II. විෂබීජ නාශක දියර බෝතල්, මුඛ ආවරණ

36.

I. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය

II. භූමිය - මුහුදුබඩ ප්‍රදේශයේ ඇති සිප්පිකටුවලින් අත් පළඳනා සෑදීම
ශ්‍රමය - යෙහෙළිය වන අයෝමිගේ සහාය ලබා ගැනීම
ප්‍රාග්ධනය - නූල්, කතුරු, ගම් හා මැලියම් මිලදී ගැනීම

37.

I. ලසිත්ගේ ව්‍යාපාරය - භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර
නිෂාලගේ ව්‍යාපාරය - සේවා නිෂ්පාදන ව්‍යාපාර

II. අයිතිකරු - ලසිත්

- ප්‍රමාණවත් ලාභයක් ලැබීම
- ව්‍යාපාරයේ අනාගත වර්ධනය

සේවකයෝ

- සාධාරණ වැටුප් ලබා ගැනීම
- රැකියා සුරක්ෂිත බව

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව